අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/12/1/2/22

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2023.12.04

අභ්‍යන්තර චක්‍රලේඛ අංක : **41/2023**

අධ්‍යාපන අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ සියලුම නීති නිලධාරීන් වෙත

**අධ්‍යාපන අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023(2024)**

2013.03.05 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ (SL 01-2016) නීති නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සහ ඊට පසුව කරන ලද සංශෝධනවලට අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2024 මාර්තු මාසයේදී විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. විභාග පරිපාටිය : විභාගය සඳහා පහත සඳහන් විෂයන් ඇතුළත් වේ.
1. ආයතන සංග්‍රහය
2. මුදල් රෙගුලාසි

නිර්දේශ පත්‍රිකාව: පහත සඳහන් විෂය කරුණු පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කරනු ලැබේ.

1) ආයතන සංග්‍රහය (පැය 01ක ව්‍යුහගත ප්‍රශ්න ඇතුළත් පත්‍රයකි.)

| | | | |
|---|---|---|---|
| II | වන පරිච්ඡේදය | - | සේවයට බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටි සහ පත්කිරීම් |
| IV | වන පරිච්ඡේදය | - | මාස් පඩි, තාවකාලික තත්ත්වය, සහ විශ්‍රාම වැටුප් හිමිකම් ප්‍රදානය කිරීම |
| V | වන පරිච්ඡේදය | - | මුදා හැරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම හා සේවය අවසන් කිරීම |
| VII | වන පරිච්ඡේදය | - | වැටුප් |
| VIII | වන පරිච්ඡේදය | - | අතිකාල දීමනා, නිවාඩු දවස් සහ නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා |
| XII | වන පරිච්ඡේදය | - | නිවාඩු |
| XIII | වන පරිච්ඡේදය | - | දුම්රිය බලපත්‍ර |
| XIV | වන පරිච්ඡේදය | - | දිවයින ඇතුළත රාජකාරි ගමන් |
| XVI | වන පරිච්ඡේදය | - | නිවාඩු ගමන් |
| XIX | වන පරිච්ඡේදය | - | රජයේ නිවාස |
| XXVIII | වන පරිච්ඡේදය | - | පරිපාලන කාර්ය පරිපාටිය හා විධි |
| XXX | වන පරිච්ඡේදය | - | රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල |
| XLVII | වන පරිච්ඡේදය | - | සාමාන්‍ය හැසිරීම හා විනය |

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති

මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන සේ දිවයිනේ ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක් ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් මත ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් නොකෙරේ. එසේම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් වූ මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති වන බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එම්.එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය